www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 1968: ප්‍රන්ස මහා වැඩ වර්ජනය සහ ශිෂ්‍ය කැරැල්ල

## 1968: The general strike and the student revolt in France

### පස්වන කොටස: ඕසීඅයි මාධ්‍යමික පිලිවෙත (1)
### Part 5: The centrist line of the OCI (1)

**පීටර් ෂ්වාට්ස් විසිනි**
**2008 සැප්තැම්බර් 4**

*මෙහි පලවන්නේ 1968 ප්‍රන්ස මැයි/ජුනි සිද්ධීන් අරභයා පලකෙරෙන ලිපි මාලාවක පස්වැන්නයි. මැයි 28 දා පලකල පලමු කොටස මැයි මස අවසානය වනවිට කූටයට ලඟාවූ ශිෂ්‍ය කැරැල්ලේ සහ මහා වැඩ වර්ජනයේ වර්ධනය පිරික්සා බලයි. මැයි 29 දා පලකල දෙවන කොටස ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය (ප්‍රකොප) සහ ඊට අනුබද්ධ වෘත්තීය සමිති සම්මේලය, සීජීටීය ජනාධිපති චාල්ස් ඩි ගෝල්ට තත්වය පාලනය කරගැනීමට උපකාරී වූ ආකාරය විමසයි. පිලිවෙලින් ජූලි 5 සහ 7 දිනවල පලකල තුන්වන සහ හතරවන කොටස් පැබ්ලෝවාදීන්ගේ භූමිකාව විමසයි. අවසන් කොටස් හතර පියරේ ලොම්බෙයාගේ ජාත්‍යන්තර කොමියුනිස්ට් සංවිධානයේ ඕර්ගනයිසේෂන් කොමියුනිස්තේ ඉන්ටර් නැෂනලිස්තේ (ඕසීඅයි) භූමිකාව පරීක්ෂා කරයි.*

ඕසීඅයි සංවිධානය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවෙන් (හජාජාක) නිල වසයෙන් බිඳී වෙන්වූයේ 1971 දී වුවත් 1968 දී එය අනුගමනය කල දේශපාලන පිලිවෙත 1950 ගනන්වල මුල් භාගයේ හජාජාක ශාඛාවන් සමග එක්ව එය ආරක්ෂා කල විප්ලවවාදී ඉදිරි දර්ශනයෙන් ඒ වන විට ත් වඩ වඩා දුරස්ථ වී ය.

1968 දී ඕසීඅයි විසින් පෙරට දමන ලද වැඩ පිලිවෙලට හතරවන ජාත්‍යන්තරයේ විප්ලවවාදී ක්‍රියාමාර්ගය ට වඩා වැඩියෙන් මාධ්‍යමිකවාදය සහ ප්‍රන්ස සින්ඩිකල්වාදය සමග පොදු වූ බොහෝ දේ තිබුනි. පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලයේ ප්‍රන්ස ආධාරකරුවන් වූ ඇලේන් ක්‍රිවින් නායකත්වය දුන් විප්ලවවාදී කොමියුනිස්ට් තරුනයෝ (ජේසීආර්) සහ පියරේ ෆ්‍රැන්ක් නායකත්වය දුන් ජාත්‍යන්තර කොමියුනිස්ට් පක්ෂය (පීසීඅයි) සමගින් ඕසීඅයි සංවිධානය ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂයේ සහ සීජීටීයේ ස්ටැලින්වාදී නායකත්වයට මැයි මහා වැඩවර්ජනයේ ගෙල මිරිකා ගෝල්වාදී තන්ත්‍රය ආරක්ෂා කිරීමට හැකිවීම සම්බන්ධයෙන් විශාල වගකීමක් දරයි.

ඕසීඅයිහි දේශපාලන පිලිවෙතේ ප්‍රධාන අක්ෂය වූයේ මධ්‍යම ස්ට්‍රයික් කමිටුවක් පිලිබඳ ඉල්ලීම යි. මේ සමග එකපෙලට හිටියේ සියල්ල අලලාගත් *''එකමුතුව'' හෙවත් ඕසීඅයි වඩාත් කැමැත්ත දැක්වූ සූත්‍රයට අනුව ''කම්කරුවන් සහ ඔවුන්ගේ සංවිධානවල එක්සත් පන්ති පෙරමුනක්'' සඳහා වූ ආයාචනය යි. 1968 තීරනාත්මක මාසවල දී ඕසීඅයි සහ එයට සහයෝගී සංවිධානවලින් නිෂ්පාදනය කරන ලද සියලු ප්‍රකාශ සහ දේශපාලන ආයාචනාවන්හි දක්නට ලැබුනු ප්‍රධාන සටන් පාඨ මේවා ය.*

මහා වැඩවර්ජනයෙන් වසරකට පසුව ප්‍රකාශයට පත්කල පිටු 300කින් යුත් පොතක වර්ජන සමයේ තම පොදු දිහානතිය ඕසීඅයි සංවිධානය සම්පින්ඩනය කොට දැක්වී ය. *''බලය සඳහා අරගලයේ දී නිර්ධනීන්ගේ මූලෝපාය හා උපාය ... 1968 මැයි මාසයේ දී ජාතික පොදු ස්ට්‍රයික් කමිටුවක් සඳහා වූ සටන් පාඨය තුල සුවිශේෂී රූපය ගත් කම්කරුවන් සහ ඔවුන්ගේ සංවිධානවල එක්සත් පන්ති පෙරමුනක් සඳහා වූ අරගලයෙන් සමන්විත විය,'' යනුවෙන් ඕසීඅයි එය සමාප්ත කලේ ය.*

ඕසීඅයිහි පුවත්පත වූ ඉන්ෆෝමේෂන් ඕරියරේහි විශේෂ *නිකුතුවක් ලෙස පලකල මෙම ග්‍රන්ථයේ කතුවරයා වන්නේ 1950 ගනන්වල සිට එහි සාමාජිකයෙක් වූ ෆ්‍රන්සුවා ඩි මැසෝ ය. ඩි මැසෝ දෛනික වර්ධනයන් පිලිබඳ සවිස්තරාත්මක වාර්තාවක් දෙන අතර ග්‍රන්ථය දේශපාලන ආයාචනා සහ පත්‍රිකා ප්‍රතිනිෂ්පාදනය ඇතුලත් ඕසීඅයිහි මැදිහත් වීම පිලිබඳ සවිස්තර ද්‍රව්‍ය සම්පාදනය කරයි. (1) ඕසීඅයිහි දේශපාලන පිලිවෙත නිවැරදිව ප්‍රස්තාරගත කිරීමේ හැකියාව පොත මගින් ලබා දෙයි.*

## එක්සත් පන්ති පෙරමුන

මාධ්‍යමිකවාදයට එරෙහි දිග්ගැස්සුනු දේශපාලන අරගලයක් හරහා හතරවන ජාත්‍යන්තරය ලොඩනැගූ ලියොන් ට්‍රොට්ස්කි එක්සත් පෙරමුනක් පිලිබඳ ඉල්ලීම කෙරෙහි තම ආකල්පය මෙසේ සම්පිණ්ඩනය කලේ ය: ''මාධ්‍යමිකයා එක්සත් පෙරමුනු පිලිවෙතින් එහි විප්ලවීය අන්තර්ගතය හිස්කොට එය උපායාත්මක ක්‍රමෝපායක සිට ඉහල ම මූලධර්මයක් බවට පරිවර්තනය කරනු ලබයි.'' 1932 දී ඔහු මාධ්‍යමික ජර්මානු සමාජවාදී කම්කරු පක්ෂය (එස්ඒපී) පිලිබඳව මෙසේ ලිවීය: ''එක්සත් පෙරමුන පිලිබඳ ප්‍රතිපත්තියට කොයි ලෙසකින්වත් විප්ලවවාදී පක්ෂයේ ක්‍රියාමාර්ගය ලෙස සේවය කල නො හැකි ය. එහෙත් දැන් එස්ඒපීයේ සමස්ත ක්‍රියාමාර්ගය ගොඩනංවනු ලබන්නේ ඒ මත ය.'' (2)

මෙම චෝදනාව ඒ හා සමානව ම 1968 ඕසීඅයි ක්‍රියාකාරීත්වයට ද අදාල වේ. එය, එක්සත් පෙරමුනු පිලිවෙත උපායාත්මක ක්‍රමයක සිට ප්‍රාථමික ක්‍රියාමාර්ගික මූලධර්මයක් බවට පරිවර්තනය කලේ ය. සියලු වෘත්තීය සමිතිවල එකමුතුව ලෙස එය වටහාගත් එක්සත් පෙරමුනේ නාමයෙන් සකල ආකාර නිර්ව්‍යාජ විප්ලවීය ආරම්භකත්වය ගැනීමකින් එය මගහැරියේ ය.

එහි සියලු ආයාචනයන් සහ ප්‍රකාශනවල සිරිත් පරිදි පෙනීසිටි ''කම්කරුවන් සහ ඔවුන්ගේ සංවිධානවල එක්සත් පන්ති පෙරමුනක්'' යන ආගන්තුක සූත්‍රයේ අර්ථභාරය වූයේ මෙය යි. පවත්නා මහජන ව්‍යාපාර නො තකා හැරීම පිලිබඳව පැල්ලෝවාදීන්ට සහ සුලු ධනේශ්වර ශිෂ්‍ය නායකයන්ට ඕසීඅයි නිවැරදිව චෝදනා කල ද එම ව්‍යාපාර කෙරෙහි ම වන්දනීය ආකල්පයක් ගත් එය කම්කරුවන් විසින් බාරගනු ලැබිය යුතු ඕනෑම අරගලයක එකලාරාමුව ඒවා මගින් සමන්විත වන බව අවධාරනය කලේ ය.

1967 ගිම්හානයේ දී ම ඕසීඅයි විසින් සංවිධානය කරන ලද විශාල රැස්වීමක් මෙවැනි යෝජනාවක් සම්මත කලේ ය: ''ස්වාභාවිකව වෘත්තීය සමිතිවල ක්‍රියාකාරීත්වයේ දැනට ම තිබෙන කම්කරුවන්ගේ සංවිධාන සහ ඔවුන්ගේ මූලස්ථානවල එක්සත් ක්‍රියාකාරීත්වයක් සාක්ෂාත් කිරීම අපගේ අභිප්‍රාය නො වන බව අපි උදාර ලෙස ප්‍රකාශ කොට සිටිමු.''

මෙම යෝජනාව තම ග්‍රන්ථයේ උපුටා දක්වන ඩි මැසෝ වෘත්තීය සමිතිවල නායකත්වයේ පිලිවෙත් නො තකා ඒවා කම්කරුවන්ගේ අවශ්‍යතා මූර්තිමත් කරන්නේය යන තර්කය මත එය සාධාරනීකරනය කිරීමේ තැතක යෙදේ.

ඔහු මෙසේ ලියයි: ''කම්කරුවන් පන්තියක් බවට පත්වන්නේ ඔවුන් සූරාකෑමට එරෙහි අරගලයේ දී වර්ධනය කල සහ පන්ති සතුරාට එරෙහිව සමගි කරන්නා වූ උපකරන ලෙස සේවය කරන සංවිධාන හරහා ය. අරගලය තුල වෛෂයිකව ඔවුන් දරන ස්ථානය -එනම් දෙන ලද ඕනෑම අවස්ථාවක තම නායකත්වයේ පිලිවෙත්වලින් ස්වාධීනව - නිසා මෙම සංවිධාන සූරාකෑමට එරෙහි අනවරත අරගලය තුල කම්කරු පන්තියේ තත්වයන් මූර්තිමත් කරති. එක්සත් කම්කරු පෙරමුනක් සාක්ෂාත් කරගනු ලැබිය හැක්කේ නිර්ධනීන්ගේ පන්ති සංවිධාන හරහා පමනි'' (අවධාරනය ඇඳිනි).

මේ තක්සේරුව මත 1968 දී වෘත්තීය සමිතිවල ධනේශ්වර-ප්‍රතිසංස්කරනවාදී ක්‍රියාමාර්ගය විවේචනය කිරීමෙන් ඕසීඅයි වැලකුනේය. සමිති නායකත්වයන්ට එරෙහිව එය ඉස්මතු කල එකම දෝෂාරෝපනය වූයේ ඔවුන් කම්කරුවන්ගේ සමගියට බාධා කල බව පමනි. ඕසීඅයිහි ම දේශපාලනික ආරම්භකත්වයන් පවා විවිධ සමිති අතර සෑම මට්ටමක දී ම සහයෝගීතාව සඳහා ආයාචනා කිරීමට සීමා කරනු ලැබිනි. අපට පසුව දැකගත හැකි වන පරිදි මධ්‍යම ස්ට්‍රයික් කොමිටියක් සඳහා වූ ඕසීඅයි ඉල්ලීමේ මූලික පදාර්ථය වූයේ මෙය යි.

පුලුල්ව බෙදා හැරුනු සිය පත්‍රිකා සහ ආයාචනාවල දී ද ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ විවෘතව විවේචනය කිරීමෙන් ඕසීඅයි වැලකුනේය. කුඩා පාඨක කවයකට දිශාගත කල න්‍යායික ලිපි සහ විශ්ලේෂන තුල ස්ටැලින්වාදයේ සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිවිප්ලවවාදී භූමිකාව සාකච්ඡා කෙරුන ද මහ ජනතාව වෙත යොමුකල පත්‍රිකාවල දී ඕසීඅයි සරලව ම කලේ ප්‍රතිසංස්කරනවාදී සහ ස්ටැලින්වාදී සමිති නායකයන්ට එක්සත් වන ලෙස ආයාචනා කිරීම පමනි.

එක්සත් පෙරමුන පිලිබඳ ඕසීඅයිහි අර්ථ නිරූපනයට මාක්ස්වාදී ව්‍යාපාරය විසින් වර්ධනය කරන ලද උපාය සමග කිසිදු පොදු දෙයක් ඇත්තේ නැත. ''අනිවාරනීය බිඳී වෙන්වීම නො තකා දෙන ලද කාලයක දී ධනවාදයට එරෙහි සිය අරගලයේ දී කම්කරු පන්තිය මත ආයත්ත වන දේශපාලන සංවිධාන අතර එක්සත් පෙරමුනක හැකියාව කම්කරු පන්තියට සහතික කිරීමේ දැවෙන අවශ්‍යතාව'' පිලිබඳව කතා කරමින් 1922 දී ලියොන් ට්‍රොට්ස්කි එක්සත් පෙරමුනක අවශ්‍යතාව පැහැදිලි කලේ ය. (3)

වසරකට පෙර කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ තුන්වන සම්මේලනය ජර්මානු කොමියුනිස්ට් පක්ෂයට (කේපීඩී) එක්සත් පෙරමුනු ප්‍රතිපත්තිය අනුගමනය කරන ලෙස අවධාරනය කොට තිබුනි. ඊනියා ''මාර්තු ව්‍යාපාරය'' හෙවත් හුදකලාව පැවතී බිඳ වැටුනු කේපීඩීයේ නැගිටීමකින් කොමින්ටර්නය පාඩම් උකහා ගත්තා ය. මෙම පරාජයෙන් එය නිගමනය කලේ කේපීඩීයට බලය ලබාගැනීමට හැකිවීමට පෙර එය මහජන

සහයෝගය ''ලබා ගතයුතු'' බවයි. *එය එක්සත් පෙරමුනු ප්‍රතිපත්තිය කම්කරුවන්ගේ ආන්ඩුවක්, ප්‍රතිසංස්කරනවාදී වෘත්තීය සමිති තුල මැදිහත්වීම සහ සංක්‍රමන ඉල්ලීම් ගනනාවක් සමග සෘජුව ම බද්ධ කලේය, මක්නිසාද යත් ට්‍රොට්ස්කි තර්ක කල ආකාරයට ''මහජනයා තරමක් වෙනස් ආකාරයකින් වුවත් විප්ලවවාදී යුගයක තම දෛනික ජීවිතය ගත කරති''. (4)*

දසවසරකට පසු යලිත් වරක් ජර්මනිය තුල එක්සත් පෙරමුනු උපාය ක්‍රියාවට දමන ලෙස ට්‍රොට්ස්කි කැඳවුම් කලේ ය. *මෙවර ප්‍රයුක්තිය වූයේ හිට්ලර් බලය ගැනීමෙන් වැලැක්වීම යි.* ජාතික සමාජවාදයේ (නාසිවාදයේ) නැගඑන තර්ජනයට එරෙහිව කොමියුනිස්ට්වරුන්ට සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට එක්සත් පෙරමුනක් තනන ලෙස ට්‍රොට්ස්කි බලකර සිටියේ ය. *පක්ෂ දෙකේම නායකයෝ එවැනි මාවතක් ගැනීම මුරන්ඩු ලෙස ප්‍රතික්ෂේප කලහ. ස්ටැලින්වාදී කේපීඩී නායකයෝ තමන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (එස්පීඩී) ''සමාජ ෆැසිස්ට්වාදීන්'' ලෙස හැඳින්වූවන් සමග සහයෝගී වීම ප්‍රතික්ෂේප කිරීම හිට්ලර්ගේ ජයග්‍රහනයට මග පාදමින් කම්කරු පන්තිය බෙදා පක්ෂඝාත කලේය.*

1920 ගනන්මුල සහ 1930 ගනන්මුල යන අවස්ථා දෙකේදී ම එක්සත් පෙරමුන ඉදිරියට දමන ලද්දේ උපායක් ලෙස මිස විප්ලවවාදී මූලෝපායට ආදේශකයක් ලෙස නො වේ. *ප්‍රායෝගික ප්‍රයුක්තීන්වල දී සහයෝගීතාවට සීමාවූ එය කේපීඩීය තමන්ගේ ක්‍රියාමාර්ගය සැඟවීම හෝ එස්පීඩීය විවේචනය කිරීමෙන් වැලකීම අදහස් නො කලේ ය.*

එක්සත් පෙරමුනේ පදනම මත සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකයන් විප්ලවවාදීන්ට බවට පරිවර්තනය කලහැකි ය යන මායාව ට්‍රොට්ස්කි කිසිවිටෙක දරා සිටියේ නැත. *ඒ වෙනුවට ඔහු එක්සත් පෙරමුන ඉලක්ක කලේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකයන්ගේ අනුහසින් මහජනයා බිඳ ගැනීමට යි.*

කොමියුනිස්ට්වාදීන්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරුවන්ට කිසිදු කොන්දේසියකින් තොරව ඔවුන්ගේ දෛනික අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ ෆැසිස්ට්වාදීන්ට එරෙහිව එස්පීඩීය සමග කන්ඩායම් ගතවීම සඳහා තමන් සූදානම් යයි ප්‍රදර්ශනය කලතාක් දුරට එය ධනේශ්වර රාජ්‍යය සමග සහයෝගී වීම ප්‍රියකල එස්පීඩීයේ නායකත්වය දුර්වල කරනු ඇත . *එවිට එස්පීඩී සාමාජිකත්වයට තමන්ගේ ම අත්දැකීම් මත පදනම්ව තමන්ගේ සංවිධානය සහ එහි නායකත්වයේ වටිනාකම තක්සේරු කල හැකිවනු ඇත.*

එක්සත් පෙරමුනු උපාය කවර තත්වයක් යටතේවත් ස්වාධීන විප්ලවවාදී ප්‍රතිපත්තිය අත්හැරදැමීමක් අදහස් කලේ නැත. 1932 දී ට්‍රොට්ස්කි මෙසේ අවධාරනය කලේ යඃ '' ව්‍යාපාරයේ පැහැදිලි අවාසියට හේතු වන ලෙස ත් මහජනයාගේ මානසිකත්වයේ තත්වය නො තකමිනුත් ප්‍රතිසංස්කරනවාදීන් අරගලයට තිරිංග යෙදීම අරඹන විටෙක ස්වාධීන සංවිධානයක් වන අපි අපගේ අර්ධ-මිත්‍රයන් නො තකා අරගලය එහි සමාප්තිය කරා ගෙනයාමේ අපගේ අයිතිය අපි හැමවිටම තබාගනිමු.'' *(5)*

## මාක්ස්වාදය වෙනුවට සින්ඩිකල්වාදය

ඕසීඅයි සංවිධානය, එක්සත් පෙරමුනු ප්‍රතිපත්තිය විප්ලවවාදී උපායක සිට වෘත්තීය සමිතිවලට තමන්ගේ යටත්වීමට අවස්ථාවාදී සාධාරනීකරනයක් බවට පරිවර්තනය කලේ ය. කම්කරුවන් සහ ශිෂ්‍යයන් විසින් මෙහෙයවනු ලබන අරගලය මෙම සංවිධානවල රාමුවට සීමා විය යුතු යයි ද කම්කරුවන් වෘත්තීය සමිති උපකරනයන් අතර ගැටුම තියුනු කරනු ඇත්තා වූ කිසිදු දේශපාලනික ආරම්භකත්වයක් ගැනීමෙන් වැලකිය යුතු යැයි ද එය අවධාරනය කලේ ය. .

ඇත්ත වසයෙන් ම සමිති තුල සංවිධානගතව සිටියේ කම්කරුවන් සුලුතරයක් පමනි. *ඒ වන විට සමිතිගතව සිටියේ කම්කරු බලකායෙන් සියයට 30 ක් පමනි (අද වනවිට එය සියයට 7කට වැටී තිබේ). සමස්ත කම්කරුවන්ගෙන් තුනෙන් දෙකක් සහ තරුනයන්ගෙන් අතිමහත් බහුතරය සංවිධානගතව නො සිටි අතර නිවැරදි ලෙස ම සමිති පිලිබඳ අවිශ්වාසයෙන් පසු වූහ. මෙම ස්ථර සමිති තුලට දිශාගත කිරීමෙන් පිටස්තර ඉදිරිදර්ශනයක් සම්පාදනය කිරීමට ඕසීඅයි අසමත් විය.*

ශිෂ්‍යයන්ව ඒ වනවිට මිචෙල් රොකාඩ් විසින් නීත සමාජ ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් සමාජවාදි පක්ෂයේ ආධිපත්‍යය යටතේ තිබූ යූඑන්ඊඑෆ් ශිෂ්‍ය සම්මේලනය වෙතට දිශාගත කරනු ලැබී ය. ඩි මැසෝ මෙසේ ලියයිඃ *''විරෝධතාව සංවිධානය කිරීමට ශිෂ්‍යයන්ට එක්සත් ජාතික ප්‍රන්ස ශිෂ්‍යයෝ නමින් වෘත්තීය සමිතියක් තිබුනි... යථා අරගලය ඇරඹීමත් සමග එහි නායකත්වයේ දෙගිඩියාව සහ දුර්වලත්වය මධ්‍යයේ වුව යූඑන්ඊඑෆ් එහි මුලුමහත් අර්ථභාරය අයත් කරගත්තේ ය. ශිෂ්‍ය වෘත්තීය සමිතියක් ලෙස එහි භූමිකාව දරමින් එහි වගකිව යුතු මැදිහත් වීම සමගින් මර්ධනයට එරෙහි අරගලය ශිෂ්‍ය ජනයා සඳහා ප්‍රයුක්තියක් බවට පත්කල එය කම්කරු සංවිධානවලට ඒවායේ ම වගකීම මුනගැස්ස වී ය. එය ශිෂ්‍යයන්ව බලමුලු ගැන්වීම සඳහා උපකරනයක් වූ අතර ම එක්සත් පෙරමුනක් සඳහා අව්‍යාජ අරගලයක් කිරීමේ හැකියාව ඇති කලේ ය.'' (මුල් කෘතියේ අවධාරනය)*

පැබ්ලෝවාදීන්ට එල්ල කරන ප්‍රහාරයක දී ඩි මැසෝ මෙසේ ලියයිඃ''ශතවර්ෂ එකහමාරකට වැඩි කාලයක් මුලුල්ලේ කරන ලද අරගල සහ කැපකිරීම් හරහා

කම්කරුවන් විසින් ස්ථාපනය කරන ලද සංවිධාන - එනම් එය පන්තියක් ලෙස සංස්ථාපනය කරන ලද, එය තමන් ම පිලිබඳවත් තමන් ප්‍රාග්ධනයට එරෙහිව යෙදී සිටින අරගලය සහ එම අරගලයට නායකත්වය දීමට පැමිණෙන බලඇනිය පිලිබඳවත් සවිඥානික වූ සංවිධාන- සරලව ම නො තකා හරිමින් පහල සිට ගොඩනැගෙන ඊනියා එක්සත් පෙරමුනක් වෙනුවෙන් කම්කරුවන්ගේ සහ ඔවුන්ගේ සංවිධානවල එක්සත් පෙරමුන සඳහා අරගලය ප්‍රතික්ෂේප කරන ඕනෑම අයෙක් මෙන් ම 'සීජීටී පාවාදීම' පිලිබඳව මොරදෙන සහ කොස්සක් අතැතිව සරල ලෙස වෘත්තීය සමිති සහ දේශපාලන පක්ෂ පන්ති අරගල සිතියමෙන් අතුගා දමන ඕනෑම අයෙක් නිලධරයන්ට සහ ධනේශ්වර රාජ්‍යයට එරෙහි අරගලයෙන් පසුබසී.''

කම්කරු පන්තිය ''තමන් ම පන්තියක් ලෙස ස්ථාපනය වන හා තමන් ම සහ තමන් ප්‍රාග්ධනයට එරෙහිව කරන අරගලය පිලිබඳව සවිඥානික වන'' සංවිධාන ලෙස මෙසේ වෘත්තීය සමිති උත්කර්ෂයට නංවනු ලැබීම මාක්ස්වාදයේ සම්ප්‍රදාය සමග මෙලොව සම්බන්ධයක් නොමැති අතර එය පැවත එන්නේ ප්‍රන්සය තුල දීර්ඝ හා කුප්‍රකට ඉතිහාසයක් සහිත සින්ඩිකල්වාදයේ සම්ප්‍රදායෙනි. *මාක්ස්වාදී ව්‍යාපාරය වෘත්තීය සමිති පිලිබඳව නිරන්තරයෙන් විවේචනාත්මක ආස්ථානයක් ගෙන ඇත. විසිවන ශතවර්ෂයාරම්භයේ දී ම ලෙනින් වෘත්තීය සමිති විඥානය වනාහි ධනේශ්වර විඥානය බවත් (1914 සිට 1918 දක්වා වැනි) අසීමිත සමාජ ආතතියේ කාල පරිච්ඡේදවල දී වෘත්තීය සමිති කම්කරු ව්‍යාපාරයේ අතිශය දක්ෂිනාංශයේ සිටින බවත් අවධාරනය කලේ ය. (6)*

ප්‍රන්ස සින්ඩිකල්වාදියෝ වෘත්තීය සමිති කටයුතුවලට දේශපාලන පක්ෂ අත නො පෙවිය යුතු ය යන පිලිවෙත අවධාරනය කලහ. *1906 දී සීජීටී වෘත්තීය සමිතිය සිය ඒමියන් කෙටුම්පත තුල වෘත්තීය සමිති සියලු දේශපාලන පක්ෂවලින් මුලුමනින් ම ස්වාධීන විය යුතු ය යන පිවෙත ඇතුලත් කලේ ය. මෙම ස්වාධීනත්වය සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ වැඩෙන තත්වාරක්ෂකවාදයට සහ පාර්ලිමේන්තු බෙලහීනත්වයට එරෙහිව යොමු කරන ලද තාක් දුරට ප්‍රන්ස සින්ඩිකල්වාදය තුල යම් විප්ලවවාදී වැදගත්කමක් ගැබ්ව තිබිනි. එය පක්ෂයේ භූමිකාව ප්‍රතික්ෂෙප කල ද ට්‍රොට්ස්කි වරක් සඳහන් කල ආකාරයට එය ''සාරයෙන් කම්කරු පන්තියේ පාර්ලිමේන්තු විරෝධී පක්ෂයකට'' වැඩි යමක් නොවීය. (7)*

කෙසේ වෙතත් වෘත්තීය සමිතිවල දේශපාලනික ස්වාධීනත්වය විප්ලවවාදී පක්ෂයේ බලපෑමට එරෙහිව යොමු කරන ලද විට තත්වය තවදුරටත් එසේ නො වීය. එවකට කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ නායක සාමාජිකයෙක් වූ ට්‍රොට්ස්කි 1921 දී මෙසේ ලිවීයඃ ''පක්ෂය සහ වෘත්තීය සමිති අතර සම්පූර්න සහ කොන්දේසි විරහිත ශ්‍රම විභජනයක් පවතිය යන න්‍යාය සහ ඒවා අන්‍යොන්‍ය හා නිරපේක්ෂ අත නො පෙවීමක් අනුගමනය කල යුතු ය යන්න ප්‍රන්ස දේශපාලන වර්ධනයන්ගේ නිෂ්පාදිතයකි. *එය එහි වඩාත් ම ආන්තික ප්‍රකාශනය යි. මෙම න්‍යාය පදනම් වන්නේ පිරිසිදු අවස්ථාවාදය මත යි.*

''සමාජවාදී පක්ෂය පාර්ලිමේන්තුවේ ප්‍රතිසංස්කරන ආරක්ෂා කරද්දී වෘත්තීය සමිති තුල සංවිධිතව සිටින කම්කරු නිලධරය වැටුප් ගිවිසුම් නිර්නය කරන තාක් ශ්‍රම විභජනය සහ අන්‍යොන්‍ය අත නො පෙවීම අඩු හෝ වැඩි වසයෙන් විය හැක්කක් වේ. *එහෙත් නිර්ධනීන් අරගලයට ඇදී ඒමත් සමග ම හා ව්‍යාපාරය අව්‍යාජ විප්ලවවාදී ස්වභාවයක් අත්පත් කරගැනීමත් සමග ම අත නො පෙවීමේ මූලධර්මය ප්‍රතිගාමී ශ්‍රාස්තාලීයවාදයක් බවට පිරිහේ.*

''කම්කරු පන්තියට ජයග්‍රහනය කලහැකි වන්නේ එහි මුදුනත සමස්ත අරගලය න්‍යායිකව සාමාන්‍යකරනය කලහැකි හා ප්‍රායෝගිකව දිශාගත කලහැකි, එහි ජීවමාන ඓතිහාසික අත්දැකීම නියෝජනය කරන සංවිධානයක් පවතීනම් පමනකි. එහි ඓතිහාසික කර්තව්‍යයේ කුදුමහත් අර්ථය අනුව ම පක්ෂයට අඩංගු කරගත හැක්කේ කම්කරු පන්තියේ වඩාත් ම සවිඥානික සහ ක්‍රියාකාරී සුලුතරය පමනි. අනෙක් අතට වෘත්තීය සමිති කම්කරු පන්තිය සමස්තයක් ලෙස වැලඳගැනීමේ මාවත් සොයයි. *කොමියුනිස්ට් පක්ෂය තුල එක්සත්ව සිටින සිය පෙරටු බලඇනියේ දෘෂ්ටිවාදාත්මක සහ දේශපාලනික නායකත්වය ක්ෂනිකව නිර්ධනීන්ට අවශ්‍ය යයි හඳුනාගන්නා අය එමගින් වෘත්තීය සමිති තුල එනම් මහජන කම්කරු සංවිධාන තුල ද නායක බලය බවට පක්ෂය පත්විය යුතු යයි හඳුනාගනිති.'' (8)*

මෙම සින්ඩිකල්වාදී සම්ප්‍රදාය ඕසීඅයි සංවිධානය තුල දීර්ඝ කාලයක් පුරා සැලකිය යුතු අනුහසක් පවත්වා තිබිනි. *යමෙක් පියරේ ලොම්බෙයා විශ්වාස කරන්නේනම් ඔහුගේ සංවිධානය වෘත්තීය සමිතිවලට තිබූ සම්බන්ධතාව සැලකිය යුතු කාලයක් මාක්ස්වාදී නොව සින්ඩිල්වාදී මූලධර්ම මත පදනම්ව තිබිනි.*

තම ජීවිතයේ අවසන්භාගයේ ලියන ලද ස්වයං-චරිතාපදානමය කෘතියක 1947 දී තම සංවිධානය තුල ද ඒමියන් කෙටුම්පත පුනස්ථාපනය කලේ යයි ලොම්බෙයා කයිවාරු ගැසුවේය. *යුද සමය තුල නීතිවිරෝධී වෘත්තීය සමිති සහ ස්ටැලින්වාදී සීජීටිය තුල වැඩ කටයුතුවල තම අත්දැකීම් මත පදනම්ව ප්‍රන්ස ට්‍රොට්ස්කිවාදී සංවිධානයේ සම්මේලනයේ දී ඔහු සංශෝධනයක් යෝජනා කල අතර ''එය ඒකමතිකව පිලිගන්නා ලද්දේ පක්ෂ සහ වෘත්තීය සමිති අන්‍යොන්‍ය වසයෙන් ස්වාධීන විය යුතු ය යන කොන්දේසි 21න් 9 සහ 10 යන වගන්තිවලට වෙනත් ඒවා ආදේශ කරමිනි.'' (9)*

''කොන්දේසි 21'' යනු 1920 කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවන ලෝක සම්මේලනයේ දී ප්‍රතිසංස්කරනවාදී සහ මාධ්‍යමික සංවිධාන බහිෂ්කරනය කිරීම සඳහා නිර්මිත සාමාජිකත්ව කොන්දේසි ය. 9වන වගන්තිය සාමාජික පක්ෂවලට ''වෘත්තීය සමිති තුල ක්‍රමානුකූලව සහ නො කඩවා කොමියුනිස්ට් ක්‍රියාකාරකම් වර්ධනය කරන'' ලෙසත් ''සෑම තැනකදී ම සමාජ ජාත්‍යෝන්මාදවාදීන්ගේ ද්‍රෝහීත්වය සහ 'මාධ්‍යමිකයන්'' ගේ වැනීම් හෙලිදරවු කරන'' ලෙසත් බලකලා ය.

10වන වගන්තියට අනුව ''කහ වෘත්තීය සමිති සංවිධානවල ඇම්ස්ටර්ඩෑම් 'ජාත්‍යන්තරයෙන්' බිඳීමක්'' සහ කොමියුනිස්ට් ජාත්‍යන්තරයට අනුබද්ධව සිටි වෘත්තීය සමිතිවල සහයෝගය අවශ්‍ය විය.

''පක්ෂ සහ වෘත්තීය සමිතිවල අන්‍යෝන්‍ය ස්වාධීනකත්වය පිලිගැනීම'' මගින් මෙම වගන්ති දෙක විස්ථාපනය කිරීමෙහි අර්ථය වූයේ ප්‍රතිසංස්කරනවාදී සහ ස්ටැලින්වාදී වෘත්තීය සමිති නිලධරයට එරෙහි දේශපාලන අරගලය අත්හැර දැමීම යි.

### දේශපාලනික හැංගිමුත්තම් කෙලීම

ඕසීඅයි සංවිධානය අවිවේචනාත්මකව වෘත්තීය සමිති උත්කර්ෂනය කල අතර එය තමන්ගේ අනන්‍යතාව අතිශය රහසිගතව තබාගනිමින් දේශපාලන හැංගිමුත්තම් කෙලියක යෙදුනේ ය. තමන්ගේ ම නමින් ඉතා කලාතුරකින් පමනක් කතාකල එය තථ්‍ය දේශපාලනික අනන්‍යතාව අඳුරේ පැවතුනු කොමිටි ඩි එලයෙන්සේ ඕව්රියේ (කම්කරු සංධාන කොමිටිය) වැනි ඉදිරි සංවිධානවල පිටුපසින් සැඟවී සිටීමට වඩා කැමති විය. ඩි මැසෝ පවා ඕසීඅයි සංවිධානය එහි නමින් සඳහන් කලේ කලාතුරකින් පමනි. තමන් සඳහන් කරන්නේ ඕසීඅයි ද එහි පෙරමුනු සංවිධානවලින් එකක් ද නැතහොත් සරලව ම ක්‍රියාකාරී වෘත්තීය සමිති ක්‍රියාකාරීන් ගැන ද යන්න විවෘතව තබමින් ඔහු සාමාන්‍යයෙන් ''විප්ලවවාදී පෙරටු බලඇනිය'' පිලිබඳව ලියයි.

ගෝල්වාදී තන්ත්‍රය සමග ගැටුම මැයි 29 දා එහි උච්චස්ථානයට ලඟා වෙද්දී හා වෘත්තීය සමිතිවල ප්‍රතිගාමී භූමිකාව වඩා පැහැදිලි වෙද්දී කම්කරු සංවිධාන කොමිටිය විසින් නිෂ්පාදිත පුලුල්ව බෙදාහැරුනු පත්‍රිකාවක් ඕසීඅයි හෝ හතරවන ජාත්‍යන්තරය ගොඩනැගීමට ආයාචනා නො කල අතර ඒ වෙනුවට ව්‍යාජ ''විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයක්'' ගොඩනැගීමට ආයාචනා කලේ ය.

මෙම ''විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය'' මනෝරාජ්‍යයක් විය. ඊට පෙර කිසිවෙක් ඒ පිලිබඳව අසා තිබුනේ නැත. එයට සාමාජිකයන්, ක්‍රියාමාර්ගයක් හෝ ව්‍යවස්ථාවක් නො වීය. එය භෞතික අවයවයක් ලෙස පැවතුනේ නැත. මෙම සංවිධානය පිලිබඳ එකම සඳහන් කිරීම 1967 දෙසැම්බර් මාසයේ දී ඕසීඅයි විසින් කෙටුම්පත් කරන ලද පිටු 40ක ප්‍රකාශනයක අගට යොදා තිබුනි.

එහි ''විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය'' විස්තර කරනු ලබන්නේ ''විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීමේ මාවතේ එන අවධියක්'' ලෙස ය. මෙම ප්‍රකාශනයට අනුව ''විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ'' ඉදිරි දර්ශනය පැනනගින්නේ ඕසීඅයි සංවිධානයේ ක්‍රියාමාර්ගයට පමනක් ''මනුෂ්‍ය වර්ගයාගේ ඓතිහාසික අර්බුදයට පිලිතුරක් සම්පාදනය කලහැකි අතර ම එහෙත් ප්‍රන්ස කම්කරු පන්තියේ සංවිධානාත්මක කේඩරයන් ක්ෂනිකව එය හා සම්බන්ධ වීමට සූදානම් නැත'' යන උපකල්පනයෙනි. (10)

මේ වර්ගයේ දේශපාලනික වෙස්මාරුකිරීම් ඕසීඅයි සංවිධානයේ ද එහි පශ්චාත් සංවිධානවල ද සමස්ත ඉතිහාසය පුරා යලි අනවරතව ඉස්මතු වේ. එය මැට්‍රියොෂ්කා බෝනික්කෙක්ව මතකයට නංවයි. එක් රුසියානු බෝනික්කෙක් තවෙකෙක් පිටුපස සැඟවෙන්නාක් මෙන් ඕසීඅයි සංවිධානය තම අනන්‍යතාව ඉදිරි හෝ වෙස්ගත් සංවිධානයක් පිටුපස සැඟවීමට මාවත් සොයයි. දේශපාලන නිරීක්ෂකයා තමන් කටයුතු කරන්නේ කවරෙක් සමගදැයි කිසිකලෙක දැන නො ගනී.

මෙම දේශපාලනික හැංගිමුත්තම් කෙලිය අවස්ථාවාදයේ සුවිශේෂී රූපාකාරයකි. ''සත්‍යය පවසනු!'' යන මූලික විප්ලවවාදී මූලධර්මයෙන් හැකිලී ගිය ඕසීඅයි සංවිධානය කම්කරුවන්ට තම සැබෑ මුහුන පෙන්වීම ප්‍රතික්ෂේප කලේ ය. කුඩා කවයන් තුල හතරවන ජාත්‍යන්තරය වෙනුවෙන් යාඥා කල එය මහජනතාවන්ට දියාරු ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කලේ ඔවුන් පිලිගැනීමට සූදානම් වන්නේ එවැන්නක් පමනකි ය යන උපකල්පනය මත පිහිටාගෙන යි.

ආඥාදායක තන්ත්‍රයක් යටතේ හෝ ප්‍රතිගාමී වෘත්තීය සමිතියක් තුල වැනි අවස්ථාවල විප්ලවවාදී පක්ෂයක් තම සමස්ත ක්‍රියාමාර්ගය විවෘතව ඉදිරිපත් නො කරන අවස්ථා සත්‍ය වසයෙන් ම තිබිය හැකි ය. එහෙත් ඕසීඅයි සම්බන්ධයෙන් ගත්කල කර්තව්‍යය වූයේ එහි අනන්‍යතාව හොඳින් දැනසිටි රාජ්‍ය යන්ත්‍රය හෝ වෘත්තීය සමිති නිලධරය රැවටීම නො වේ. ඕසීඅයි රැවටුවේ නව දිහානතකියක් සෙවීමේ අපේක්ෂාවෙන් දේශපාලන ජීවිතයට ඇතුලත්ව සිටි කම්කරුවන් හා තරුනයන්ව ය.

විශේෂයෙන් ම ඕසීඅයි සංවිධානය තීව්‍ර ලෙස සහයෝගය පැතු වෘත්තීය සමිති නිලධරයේ පහල අංශයන් කිසිදු අපහසුතාවකට පත් නො කිරීමට සංවේදී විය. තම අනන්‍යතාව සැඟවීම මගින් මෙම ක්‍රියාකාරීන්ට නිලධරයේ ප්‍රති-ට්‍රොට්ස්කිවාදී ඉහල

*තරාතිරම් සමග ගැටීමේ අන්තරායකින් තොරව ඕසීඅයි සමග සබඳතා ඇතිකරගැනීමේ හැකියාව එය විවර කලේ ය.*

මෙම පහල තරාතිරම්වල වෘත්තීය සමිති ක්‍රියාකාරීන්ව ඕසීඅයි විස්තර කලේ එහි ලියවිලිවල යලියලිත් පුනරුච්චාරනය කල දෙපදයක් වන ''කම්කරු පන්තියේ සංවිධානාත්මක කේඩර'' හෝ ''පන්තියේ ස්වාභාවික සංවිධායකයන්'' ලෙස ය. *සමස්තයක් ලෙස සාමාජිකත්වය මත පාලනය පවත්වාගෙන යාම සඳහා සමිති යන්ත්‍රනයට මෙම ස්ථරය තීරනාත්මකව වැදගත් බව ඕසීඅයිට හොඳින් පැහැදිලි විය. එසේ වුවත් එය තර්ක කලේ නිලධරයේ ඉහල හා පහල මට්ටම් -එනම් ''යන්ත්‍රනය'' හා ''කේඩරය''- අතර ගැටුම පසුව කී අයවලුන්ව විප්ලවවාදී දිහාවකට තල්ලු කරනු ඇති බව යි.*

1968 වසරාරම්භයේ පක්ෂය ලා වෙරිතේ හි පලකල ප්‍රකාශනයක් ''කේඩර'' වනාහි ''ඉහල යන්ත්‍රනය -සියල්ලට ඉහලින් ස්ටැලින්වාදී යන්ත්‍රනය- පන්තිය මත තම පාලනය රඳගැනීමට උපයෝගී කරගන්නා මැදිහත්කරුවන් සහ නිර්ධනීන්ට පන්තියක් ලෙස වර්ධනය වීමට හා සංවිධානය වීමට හැකි කරන සටන්කාමී ස්ථරය යන දෙකම'' යයි විස්තර කලේ ය. *එම ප්‍රකාශයේ ම වැඩිදුරටත් සඳහන් වූයේ මෙම ''සංවිධානාත්මක කේඩරය 10,000 ත් 15,000ත් අතර කියාකාරීන්ගෙන් සමන්විත වන අතර බොහෝ දුරට කොමියුනිස්ට් පක්ෂය මගින් පාලනය කරනු හා සංවිධානය කරනු ලැබෙති'' යි සඳහන් විය. (11)*

ඕසීඅයි සංවිධානය තමන්ගේ ම කර්තව්‍යය ලෙස දැකගත්තේ ''විරෝධය පෑමේ අවශ්‍යතාවය සහ තමන්ගේ පන්තිය සමගින් සටන් කිරීමට බලකෙරෙන මෙම ක්‍රියාකාරීන් සහ සංවිධානමය කේඩරයන්, යන්ත්‍රනයේ ධනේශ්වර හිතවාදී දිශානතිය සමග ගැටුමට ගෙනඑන වෛෂයික පරස්පරවිරෝධයන් සහ පරිනතභාවය භේදය කරා තල්ලු කිරීම'' ය.

ඉහත උපුටා දක්වන ලද ඡේද පැබ්ලෝවාදය මත එල්ල කෙරුනු දරුනු ප්‍රහාරයක් සමග සම්බන්ධිත ය. එහෙත් *යථාර්ථයේ දී 1968 දී වෘත්තීය සමිති සහ ස්ටැලින්වාදය සම්බන්ධයෙන් ඕසීඅයි සංවිධානයේ ආකල්පය 1953 පැබ්ලෝවාදය සමග තථ්‍යසමව අනන්‍ය විය.*

එසමයේ දී පැබ්ලෝ නිගමනය කර තිබුනේ නව විප්ලවවාදී ප්‍රහාරයක් වර්ධනය වනු ඇත්තේ හතරවන ජාත්‍යන්තරයේ ධජය යටතේ සංවිධානය වන කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයක් ලෙසින් නොව වෛෂයික සිද්ධීන්ගේ පීඩනය යටතේ වමට තල්ලු වීමට බලකෙරෙන ස්ටැලින්වාදී යන්ත්‍රනයන්ගේ රූපාකාරයකින් බවයි. *එයට සමාන තාලයකින් ඕසීඅයි අපේක්ෂා කලේ විප්ලවවාදී වර්ධනයක් ''සංවිධාන තුල ඇතිවන අභ්‍යන්තර විභේදනයකින් සහ යන්ත්‍රනය සහ පන්තියේ සංවිධානමය කේඩරයන් අතර වර්තමාන පරස්පරවිරෝධය මෝරා වැඩීමෙන්'' ඉස්මතු වනු ඇති බව යි. (12)*

1968 දී වෘත්තීය සමිති සහ කොමියුනිස්ට් පක්ෂය තුල ප්‍රගාඪ බෙදීම් සහ ආතතීන් තිබුනේ වුව ද විප්ලවවාදී ව්‍යාපාරයක් වර්ධනය විය හැකිව තිබුනේ ස්ටැලින්වාදයට එරෙහි විවෘත අරගලයක් සහ එය සමග දේශපාලනික බිඳීමක් තුල පමනි. *එහෙත් ඕසීඅයි සංවිධානය මෙම කර්තව්‍යය වැලැක්වූයේ එක්සත් පෙරමුනු උපාය මූලෝපායක් බවට එසවීම සහ තමන්ගේ ම අනන්‍යතාවය සැඟවීම මගිනි.*

ස්ටැලින්වාදීන් ම විප්ලවවාදී දිහාවකට හැරිය හැකි යයි අඟවන තවත් බොහෝ උද්ධෘත ඩි මැසෝගේ කෘතියේ තිබේ.

උදාහරනයක් ලෙස කතුවරයා, මැයි 13 දා ස්ටැලින්වාදී තරුන සංවිධානය කල ඉල්ලීම උත්කර්ෂයට නංවන්නේ එය ''රැඩිකල් වම''ට ප්‍රහාර එල්ල නො කල නිසාත් පාඨශාලා ශිෂ්‍යයන්, උසස් විද්‍යාල ශිෂ්‍යයන් සහ තරුන කම්කරුවන්ගේ එකමුතුවට ආයාචනා කල නිසාත් කම්කරුවන්ගේ ආන්ඩුවක් වෙනුවෙන් කතා කල නිසාත් ය. *ඩි මැසෝ මෙසේ අදහස් දක්වයිඃ*

''යන්ත්‍රනය හුදෙක් එයට ව්‍යාපාරය අනුගමනය කිරීමට බලකෙරෙනවා යයි දැකගන්නවා පමනක් නො වේ. *තම පාලනය නඩත්තු කරගෙන යාමටත් කම්කරු පන්තිය තුල ආරම්භකත්වය යලි ලබාගැනීම සඳහාත් එය යම් ආකාර රූපාකාරයකින් සහ යම් සීමාවන් තුල එය පෙරටුවෙන් ද ගමන් කරයි. නායකත්වය ද ගනී... එම මාවතේ ගමන් කරන යන්ත්‍රනය තමන් වටා ම ක්‍රියාකාරීන් රැලි කරගනිමින් සමස්තයක් ලෙස කම්කරු පන්තිය රැඩිකලීකරනය කරයි.'' (13)*

**මතු සම්බන්ධයි**

**සටහන්ඃ**

1. " François de Massot, "La grève générale (Mai-Juin 1968)," Supplément au numéro 437 d' "Informations Ouvrières." *ප්‍රන්ශුවා ඩි මැසෝ, ''ලා ග්‍රේව් ජෙනරලේ (1968 මැයි-ජූනි),'' සප්ලිමන්ට් ඕ නූමරෝ 437 ඩී ''ඉන්ෆොමේෂන්ස් ඕරියරේ.'' ඉහත ලිපියේ සියලු උපුටාගැනීම් වෙනත් ආකාරයකින් දක්වා නොමැතිනම් ඒ මෙම කෘතියෙනි.*

2. Leon Trotsky, Two Articles On Centrism" (February/March 1934), *ලියොන් ට්‍රොට්ස්කි, ''ටූ ආර්ටිකල්ස් ඔන් සෙන්ට්‍රිස්ම්''* (මාධ්‍යමිකවාදය පිලිබඳ

*ලිපි දෙකක්) (1934 පෙබරවාරි-මාර්තු), ලියොන් ට්‍රොට්ස්කි,"වට් නෙක්ස්ට්? වයිටල් ක්වෙෂ්චන්ස් ෆෝ ජර්මන් ප්‍රොලිටාරියේට්" (ඊ ළඟට කුමක් ද? ජර්මානු නිර්ධනීන් මුහුන දෙන තීරනාත්මක ප්‍රශ්න) (1932 ජනවාරි)*

3. Leon Trotsky,."*What Next? Vital Questions for the German Proletariat" (January 1932). ලියොන් ට්‍රොට්ස්කි, "වට් නෙක්ස්ට්? වයිටල් ක්වෙෂ්චන්ස් ෆෝ ජර්මන් ප්‍රොලිටාරියේට්" (ඊ ළඟට කුමක් ද? ජර්මානු නිර්ධනීන් මුහුන දෙන තීරනාත්මක ප්‍රශ්න) (1932 ජනවාරි)*

4. Leon *Trotsky, "The Third International After Lenin"*

*ලියොන් ට්‍රොට්ස්කි, "ද තර්ඩ් ඉන්ටර්නැෂනල් ආෆ්ටර් ලෙනින්" (ලෙනින්ගෙන් පසු තුන්වන ජාත්‍යන්තරය)*

5. . Leon Trotsky, *"What Next? Vital Questions for the German Proletariat" (January 1932).*

*ලියොන් ට්‍රොට්ස්කි, "වට් නෙක්ස්ට්? වයිටල් ක්වෙෂ්චන්ස් ෆෝ ජර්මන් ප්‍රොලිටාරියේට්" (ඊ ළඟට කුමක් ද? ජර්මානු නිර්ධනීන් මුහුන දෙන තීරනාත්මක ප්‍රශ්න) (1932 ජනවාරි)*

6. On the attitude of the Marxist movement to the trade unions see: David North, *"Marxism and the Trade Unions"*

වෘත්තීය සමිති පිලිබඳ මාක්ස්වාදී ව්‍යාපාරයේ ආකල්පය ගැන ඩේවිඩ් නෝර්ත්ගේ "මාක්සිස්ම් ඇන්ඩ් ද ට්‍රේඩ් යුනියන්ස්" (මාක්ස්වාදය සහ වෘත්තීය සමිති) බලන්න.

7. . Leon Trotsky, "A School of Revolutionary Strategy" *ලියොන් ට්‍රොට්ස්කි, "අ ස්කූල් ඔෆ් රෙවලූෂනරි ස්ට්‍රැටජි" (විප්ලවවාදී මූලෝපායේ ගුරුකුලයක්)*

8. . Leon Trotsky, "A School of Revolutionary Strategy"

*ලියොන් ට්‍රොට්ස්කි, "අ ස්කූල් ඔෆ් රෙවලූෂනරි ස්ට්‍රැටජි" (විප්ලවවාදී මූලෝපායේ ගුරුකුලයක්)*

*9.* Daniel Gluckstein, Pierre Lambert, "Itinéraires," Éditions du Rocher 2002, *ඩැනියෙල් ග්ලූක්ස්ටයින්, පියරේ ලොම්බෙයා, "ඉටිනරෙයාරෙස්," එඩිෂන්ස් ඩ්‍යු රෝෂර් 2002, 51 පිටුව*

10. . *La vérité*, no. 541, avril-mai 1968 ලා වෙරිතේ, අංක 541, 1968 අප්‍රේල්-මැයි

11. . "Le bonapartisme gaulliste et les tâches de l'avant-garde," *la vérité* No. 540, février-mars 1968, "ල බොනපාටිස්මේ ගෝලිස්තේ එට් ලේ ටාචස් ඩි ල'ඇවන්ට්-ගාඩ්," ල වෙරිතේ අංක 540, 1968 පෙබරවාරි-මාර්තු, 13-14 පිටු

12. "Le bonapartisme gaulliste et les tâches de l'avant-garde," *la vérité* No. 540, février-mars 1968, "ල බොනපාටිස්මේ ගෝලිස්තේ එට් ලේ ටාචස් ඩි ල'ඇවන්ට්-ගාඩ්," ල වෙරිතේ අංක 540, 1968 පෙබරවාරි-මාර්තු, 15 පිටුව

13. François de Massot, « La grève générale (Mai-Juin 1968)," *ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (1968 මැයි-ජුනි)," 58 පිටුව*


© www.wsws.org